සිංහල රීතිය - 2

# අක්ෂර හා අක්ෂරාණු


දේශමාන්‍ය
සාහිත්‍ය සූරී
සම්මානිත මහාචාර්ය

**ජේ. බී. දිසානායක**

කොළඹ විශ්වවිද්‍යාලය


(c) Sumitha Publishers

**සුමිත පොතක්**

සිංහල රීතිය - 2

# අක්ෂර හා අක්ෂරාණු

ප්‍රථම මුද්‍රණය 2013

© ජේ. බී. දිසානායක

**ISBN 978-955-0335-56-5**

(c) Sumitha Publishers

කවරය
සමන් පිරිවර්ධන

ප්‍රකාශනය:

**සුමිත ප්‍රකාශකයෝ**
info@sumithabooks.com
www.sumithabooks.com

මුද්‍රණය:

SRIDEVI

**ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.,**
27, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල
දුරකථනය : 2716709

# සිංහල රීතිය

සමාජය යනු මිනිසුන්ගේ එකතුවකි. සමාජයක යහ පැවැත්ම රඳා පවතින්නේ මූලික කරුණු දෙකක් මත ය. පළමුවැන්න, එහි පවත්නා 'නීති' සමුදාය යි. දෙවැන්න, එහි පවත්නා 'රීති' සමුදාය යි. නීතියක් රීතියක් නැති සමාජය අවුලින් අවුලට පත් වේ. නීති හා රීති අතර පවත්නා මූලික වෙනස්කම් හඳුනා ගැනීම භාෂාවේ ස්වභාවය හඳුනා ගැනීමට මහත් සේ උපකාරි වේ.

විවාහය පිළිබඳව නීති පද්ධතියක් මෙන් ම රීති පද්ධතියක් ද ඇත. විවාහ වන දෙදෙනාගේ වයස් සීමාව ගැන නීතියක් ඇත. විවාහ වන දා මනමාලිය පෝරුවෙහි සිට ගත යුත්තේ කෙසේ ද යන්න ගැන නීතියක් නැත. එහෙත් ඈ සිට ගත යුත්තේ මනමාලයාගේ වම් අත පැත්තෙහි ය යනුවෙන් රීතියක් ඇත. විවාහ වන දාට 'ජය මංගල ගාථා' කියා ආශීර්වාද කළ යුතු යැයි නීතියක් නැතත් රීතියක් ඇත.

නීති හා රීති අතර මූලික වෙනස්කම් තුනක් දක්නට ලැබේ. පළමුවැන්න, නීති හා රීති උපදින ආකාරය යි. නීතියක් උපදින්නේ එය කිසියම් බලධර මණ්ඩලයක් විසින් පනවනු ලැබීමෙනි. මේ බලය බොහෝ විට පැවරෙන්නේ පාර්ලිමේන්තුවට හෙවත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ය. රීතියක් උපදින්නේ පාර්ලිමේන්තුව වැනි බලධර මණ්ඩලයකින් නොව මුළු මහත් සමාජයෙනි. මඟුල් පෝරුවේ සිරිත් විරිත් සම්මත කොට ගෙන ඇත්තේ ආඥා පනතකින් නොව මුළු මහත් සමාජය විසිනි.

දෙවැන්න, නීති හා රීති සංග්‍රහ කොට ඇති ආකාරය යි. සමාජයකට බල පාන ඒ ඒ නීති කිසියම් ලේඛනයක සංග්‍රහ කොට ඇත. විවාහයට අදාළ සියලු නීති විවාහ ආඥා පනතෙහි ලේඛනගත කොට ඇත. වගන්ති හා උපවගන්ති වශයෙන් ඒ නීති ඉදිරිපත් කෙරේ. එහෙත් විවාහයට අදාළ සිරිත් විරිත් හෙවත් රීති ඇතුළත් ලේඛනයක් නැත.

තෙවැන්න, නීති හා රීති උල්ලංඝනය කළ විට ඇති වන විපාක යි. නීතියක් බින්ද විට එය දඬුවම් ලැබිය යුතු වරදක් වේ. දඬුවම් පැමිණවීම පොලිසියෙහිත් උසාවියෙහිත් කාර්ය භාරය යි. එහෙත් රීතියක් බිඳුණු විට පොලිසියෙන් හෝ උසාවියෙන් දඬුවම් පැමිණෙන්නේ නැත. මඟුලක් නොකා විවාහයක් කර ගත හොත් ඉන් පොලිසියට ප්‍රශ්නයක් නැතත් සමාජයට ප්‍රශ්නයක් ඇති එසේ කරන්නට ඇත්තේ ඇයි දැයි සමාජය විමසන්නට පටන් ගනී. ඒ අනුව නොයෙක් කටකතා පැතිර යනු ඇත. එයින් වන අපහාසය උසාවියෙන් ලැබෙන දඬුවමට වඩා බරපතල විය හැකි ය.

භාෂාව සැදී ඇත්තේ නීති පද්ධතියකින් නොව **රීති පද්ධතියකින්** බව අවධාරණය කළ යුතු ය. සිංහලයෙහි අකුරු යෙදිය යුත්තේ මෙසේ යැයි කියා හෝ පද සන්ධි කළ යුත්තේ මෙසේ යැයි කියා හෝ පද හෝ වාක්‍ය සදා ගත යුත්තේ මෙසේ යැයි කියා හෝ නීතියක් නැත. එසේ කළ යුත්තේ අසවල් ආඥා පනතෙහි එන අසවල් වගන්තිය අනුව යැයි කිව නොහේ.

එසේ වුවද නිවැරදිව අකුරු යෙදිය යුතු ආකාරය (අක්ෂර වින්‍යාසය), පද සන්ධි කළ යුතු ආකාරය (අක්ෂර සුසංයෝගය), පද සදා ගත යුතු ආකාරය (පද සාධනය) හා වාක්‍ය සදා ගත කළ යුතු ආකාරය (වාක්‍ය සාධනය) පිළිබඳව රීති පද්ධතියක් ඇත. මේ රීති පනවන ලද්දේ බලධරයන් විසින් නොව භාෂාව භාවිත කරන්නන් විසිනි.

භාෂාවක භාවිතය අළලා පවතින රීති පද්ධතිය 'ව්‍යාකරණය' නම් වේ. මේ රීති කලින් කලට වෙනස් වෙමින් පරිණාමයට පත් වේ. එබැවින් ඒ ඒ කාල පරිච්ඡේදවල පවත්නා ව්‍යාකරණ රීති කවරේ දැයි ව්‍යවහාරානුසාරයෙන් විමසා බැලීම වාග්විද්‍යාඥයාගෙත් ව්‍යාකරණඥයාගෙත් වගකීම වේ.

'සිංහල රීතිය' නමැති මේ පොත් පෙළේ අරමුණ සමකාලීන සමාජයෙහි සිංහල භාෂාව භාවිත වන ආකාරය විද්‍යාත්මකව විමසා බලා ඊට අදාළ රීති සමුදාය කෙබඳු දැයි විධිමත්ව හෙළි පෙහෙළි කිරීම යි. එසේ කිරීමෙන් සමකාලීන සිංහලයන් සිතන පතන ආකාරය හඳුනා ගැනීමට සිංහල පාඨක ලෝකයාට හැකි වනු ඇත.

(c) Sumitha Publishers

# පෙර වදන

භාෂාවක් කතා කිරීමට යොදා ගන්නේ 'ශබ්ද' යි. මේ ශබ්ද නිකුත් කෙරෙන්නේ මුවිනි. මුවෙහි ඇති දිව, රසදිව, තොල්, දත් හා තල්ල ආදිය විවිධ ආකාරයෙන් හැසිරවීමෙන් මේ ශබ්ද උපදවනු ලැබේ. මේ ශබ්ද සියල්ල මූලික වශයෙන් දෙ වර්ගයකට වැටේ. 'ස්වර ශබ්ද' හා 'ව්‍යංජන ශබ්ද' යනුවෙනි.

භාෂාවක් ලිවීමට යොදා ගන්නේ 'රූප' යි. මේ රූප ද විවිධ වේ. චීන භාෂාව ලිවීමට යොදා ගන්නා රූප ඉංග්‍රීසි භාෂාව හෝ සිංහල භාෂාව හෝ ලිවීමට යොදා ගන්නා රූපවලට වඩා වෙනස් ය. ඉංග්‍රීසි හා සිංහල වැනි භාෂා ලිවීමට යොදා ගන්නා රූප හැඳින්වීමට 'අක්ෂර' 'අකුරු' හෝ 'වර්ණ' යන නම් යෙදේ. එබැවින් භාෂාවක් ලිවීමට යොදා ගන්නා අකුරු සියල්ල හැඳින්වීමට 'අක්ෂර මාලාව' හෝ 'වර්ණ මාලාව' යන නම යෙදේ.

(c) Sumitha Publishers

ඉංග්‍රීසියෙන් ලියන විටත් සිංහලයෙන් ලියන විටත් අනුගමනය කෙරෙන්නේ එක ම රීතියක් නොවේ. අල්පෙනෙත්ත යන අර්ථවත් pin (පින්) යන ඉංග්‍රීසි පදයෙහි ශබ්ද 3 ක් ඇතුළත් වේ. එකක් i (ඉ) යන ස්වරය යි. දෙකක් p (ප්) හා n (න්) යන ව්‍යංජන ශබ්ද යි. මේ ස්වර හා ව්‍යංජන ශබ්ද වෙන් කොට ලිවීම ඉංග්‍රීසි රීතිය යි :

| | | |
|---|---|---|
| p | i | n |
| ප් | ඉ | න් |

එහෙත් සිංහල රීතිය එසේ නොවේ. ව්‍යංජනයකට පසුව යෙදෙන ස්වර ශබ්දය වෙන් කොට ලියන්නේ නැත. ඒ වෙනුවට ඊට මුලින් යෙදෙන 'ප්' අකුරට ම ලකුණක් හෙවත් ඉස් පිල්ලක් එකතු කිරීම සිංහල රීතිය යි. මෙසේ ය:

| | | |
|---|---|---|
| p | i | n |
| ප් | ඉ | න් |
| පි | | න් |

'අක්ෂර' වෙනුවට යෙදිය හැකි මෙවැනි පිලි හෙවත් ලකුණු හැඳින්වීමට 'අක්ෂරාණු' යන අලුත් නම මෙහි යොදමු. එය සැදෙන්නේ 'අක්ෂර' හා 'අණු' යන පද දෙක සන්ධි කිරීමෙනි:

අක්ෂර + අණු = අක්ෂරාණු

ඉංග්‍රීසියෙන් ලිවීමට අක්ෂරාණු අවශ්‍ය නැත. අක්ෂරාණු නැතිව ලිවීමේ රීතිය හැඳින්වෙන්නේ 'අක්ෂරපාදක ලේඛනය' (alphabetic writing) යන නමිනි. අක්ෂරාණු ඇතිව ලිවීමේ රීතිය හැඳින්වෙන්නේ 'මාත්‍රාපාදක ලේඛනය' (syllabic writing) යනුවෙනි. සිංහල ලේඛනයෙහි ලා භාවිත කෙරෙන අක්ෂරාණු තුන් වර්ගයකි.

පළමුවැනි වර්ගයට අයත් වන්නේ ගාත්‍රාක්ෂරයක ඇතුළත් වන ස්වරය ඉවත් කිරීම පිණිස යොදා ගන්නා 'කොඩිය' හා 'රැහැන' යන 'අල් ලකුණු' වර්ගය යි.

දෙවැන් වර්ගයට අයත් වන්නේ ව්‍යංජනයකට පසුව එන ස්වරය ලියා දැක්වීම පිණිස යොදා ගන්නා 'ඇල පිල්ල' 'ඉස් පිල්ල' 'ගයනුකිත්ත' වැනි 'පිලි' වර්ගය යි.

තුන්වැනි වර්ගයට අයත් වන්නේ ව්‍යංජනයට පසුව එන ව්‍යංජනයක් ලිවීම පිණිස යොදා ගන්නා 'යංශය' වැනි ලකුණු වර්ගය යි. 'යංශය' යෙදෙන්නේ ව්‍යංජනයකට පසුව එන 'ය' යන්න වෙනුවට ය.

සිංහල අක්ෂර හා අක්ෂරාණු හඳුන්වා දීම මේ පොතේ අරමුණ යි. 'අක්ෂර හා අක්ෂරාණු' නමැති මේ පොතේ අරමුණ සිංහලයෙන් ලියන විට අනුගමනය කරනු ලබන රීති සමහරක් හඳුන්වා දීම යි.

**ජේ. බී. දිසානායක**

2 ඒ, පීටර්ස් පෙදෙස
නුගේගොඩ

# පටුන


1. ශබ්දයෙන් අක්ෂරයට 7
2. අක්ෂර අනුපිළිවෙළ 8
3. අක්ෂර හා අක්ෂරානු 10
4. අක්ෂර පරිමාණ 12
5. ගාත්‍රාක්ෂර අල් කිරීම 14
6. අල් ලකුණු 16
7. අල් ලකුණු භාවිතය 18
8. ස්වර පිලි හඳුන්වන නාම 20
9. ස්වර පිලි හැඳින්වීමට සුදුසු නාම 22
10. අක්ෂරාණු පරිමාණ 24
11. මූල රීති, අනුරීති, ව්‍යතිරේක හා විකල්ප රීති 26
12. ස්වර පිලි නැති පද 28
13. 'ආ' යන්න : ඇල පිල්ල 30
14. 'ඇ' යන්න : කෙටි ඇද පිල්ල 32
15. 'ඈ' යන්න : දික් ඇද පිල්ල 34
16. 'ඉ' යන්න : කෙටි ඉස් පිල්ල 36
17. 'ඊ' යන්න : දික් ඉස් පිල්ල 38
18. 'උ' යන්න : කෙටි පා පිල්ල 40
19. 'ඌ' යන්න : දික් පා පිල්ල 42
20. 'ඍ' යන්න : කෙටි ගැට පිල්ල 44
21. 'ඎ' ස්වරය : දික් ගැට පිල්ල 46
22. 'එ' යන්න : කොම්බුව 48
23. 'ඒ' යන්න : කොම්බුව හා තවත් පිලි 50
24. 'ඓ' යන්න : කොම්බු දෙක 52
25. 'ඔ' යන්න : කොම්බුව හා ඇල පිල්ල 54
26. 'ඕ' යන්න : කොම්බුව හා උස් ඇල පිල්ල 56
27. 'ඖ' යන්න : කොම්බුව හා ගයනුකිත්ත 58
28. 'ය' යන්න : යංශය 60
29. 'ර' යන්න : රකාරාංශය 62
30. 'ර' යන්න : රේඵය 64
31. 'අ' යන්න : ඇල පිල්ල 66
32. බැඳි අකුරු 68
33. සිංහල, දෙමළ හා සියම් පිලි 70


(c) Sumitha Publishers

# 1
# ශබ්දයෙන් අක්ෂරයට

අකුරු හෙවත් අක්ෂර යනු භාෂාවක එන ශබ්ද ඇසට පෙනෙන සේ ලියා දැක්වීමට ගන්නා රූප, ලකුණු හෙවත් සංකේත යි. ඉංග්‍රිසිකාරයෝ ඉංග්‍රිසියෙන් ලිවීම සඳහා එවැනි අක්ෂර හෙවත් letters (ලෙටර්ස්) 26 ක් භාවිත කරති.

ඉන් 5 ක් vowels (වවල්ස්) හෙවත් ප්‍රාණාක්ෂර වේ. මෙසේ ය:

| | | | | |
|---|---|---|---|---|
| a | e | i | o | u |

(c) Sumitha Publishers

සෙසු අකුරු consonants (කොන්සොනන්ට්ස්) හෙවත් ගාත්‍රාක්ෂර වේ:

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| b | c | d | f | g | h | j |
| k | l | m | n | p | q | r |
| s | t | v | w | x | y | z |

මේ අකුරක් පදයක කවර තැනක යෙදුණත් එහි රූපය වෙනස් නොවේ. නිදසුනක් වශයෙන් ‘i’ යන ප්‍රාණාක්ෂරය පදයක මුලත් මැදත් යෙදෙන්නේ එක ම ආකාරයෙනි:

| මුල | මැද |
|---|---|
| it | sit |
| in | pin |

එහෙත් සිංහල ‘ඉ’ යන ප්‍රාණාක්ෂරය එසේ නොවේ. එය පදයක මුල එන විට ‘ඉ’ යන රූපයෙන් ද වෙනත් තැනක එන විට ‘ ි ’ යන රූපයෙන් ද යෙදේ. යට කී ඉංග්‍රිසි පද සිංහලයෙන් ලියා බලමු:

| මුල | මැද |
|---|---|
| **ඉට්** | **සිට්** |
| **ඉන්** | **පින්** |

සිංහල පදයක මුල යෙදෙන රූපය සඳහා **‘අක්ෂරය’** යන නමත් වෙනත් තැන්වල යෙදෙන රූපය සඳහා **‘අක්ෂරාණුව’** යන නමත් භාවිත කළ හැකි ය. ඉංග්‍රිසි භාෂාවේ ඇත්තේ අක්ෂර පමණකි. අක්ෂරාණු යෙදීමක් එහි නැත. සිංහලයෙහි අක්ෂර මෙන්ම අක්ෂරාණුත් යෙදේ. සිංහල අක්ෂරත් ඒවාට සම්බන්ධ අක්ෂරාණුත් නිදසුන් සහිත ව හඳුන්වා දීම මේ පොතේ අරමුණ යි.

# 2

# අක්ෂර අනුපිළිවෙළ

අද භාවිත වන සිංහල අක්ෂර මාලාවෙහි අකුරු 59ක් ඇත. අද භාවිත නොවන ඉලු-යන්න හා ඉලූ-යන්න ද එක් කොට ගත් විට සිංහල හෝඩියෙහි අක්ෂර සංඛ්‍යාව 61 වේ. මෙකී අක්ෂර 59 අකාරාදියක හෙවත් ශබ්දකෝෂයක යෙදෙන අනුපිළිවෙළ **'අකාරාදි පිළිවෙළ'** යනුවෙන් හැඳින්වේ. පහත දැක්වෙන්නේ මේ අනුපිළිවෙළ යි.

මේ සඳහා ආදර්ශ වශයෙන් ගත්තේ පූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමිපාණන්ගේ 'ශ්‍රී සුමංගල ශබ්දකෝෂය' හා අධිනීතිඥ හරිශ්චන්ද්‍ර විජයතුංගයන්ගේ 'මහා සිංහල ශබ්දකෝෂය' යි.

(c) Sumitha Publishers

හෝඩිය දක්වන තැන මුලින් ම එන්නේ අ-යන්න වුවත් යටකී ශබ්දකෝෂවල මුලින් ම එන්නේ 'අං' හා 'අ:' යන අර්ධ ගාත්‍රාක්ෂර දෙක බව පෙනේ.

ඒ අනුව සිංහල අකාරාදි පිළිවෙළ මෙසේ දක්වමු:

**1. අර්ධ ගාත්‍රාක්ෂරඃ 2**

| | ගතකුරකට පසුව |
|---|---|
| අං | කං |
| අඃ | කඃ |

**2. ප්‍රාණාක්ෂර : 16**

| | |
|---|---|
| අ | ක |
| ආ | කා |
| ඇ | කැ |
| ඈ | කෑ |
| ඉ | කි |
| ඊ | කී |
| උ | කු |
| ඌ | කූ |
| ඍ | කෘ |
| ඎ | කෲ |
| එ | කෙ |
| ඒ | කේ |
| ඓ | කෛ |
| ඔ | කො |
| ඕ | කෝ |
| ඖ | කෞ |

**3. ගාත්‍රාක්ෂර : 41**

| | |
|---|---|
| | ථ |
| ක | ද |
| ඛ | ධ |
| ග | න |
| ඝ | ඳ |
| ඞ | ප |
| ඟ | ඵ |
| ච | බ |
| ඡ | භ |
| ජ | ම |
| ඣ | ඹ |
| ඤ | ය |
| ඥ | ර |
| ඦ | ල |
| ට | ව |
| ඨ | ශ |
| ඩ | ෂ |
| ඪ | ස |
| ණ | හ |
| ඬ | ළ |
| ත | ෆ |

(c) Sumitha Publishers

# 3
# අක්ෂර හා අක්ෂරාණු

භාෂණයෙහි එන්නේ කනට ඇසෙන ශබ්ද යි. ලේඛනයෙහි එන්නේ ඇසට පෙනෙන රූප යි. සිංහල භාෂණයෙහි එන ශබ්ද ලියා දැක්වීම පිණිස යෙදෙන රූප දෙ වර්ගයකි:

1 අක්ෂර

2 අක්ෂරාණු

### අක්ෂර

**'අක්ෂර'** යනු කිසියම් ශබ්දයක් ලියා දැක්වීම පිණිස යෙදෙන මූලික රූපය යි. 'ඉ' යන ස්වර ශබ්දය ලියා දැක්වීම පිණිස යෙදෙන 'ඉ' යන රූපයත් 'ය' යන ව්‍යංජන ශබ්දය ලියා දැක්වීම පිණිස යෙදෙන 'ය' යන රූපයත් අක්ෂර වේ.

(c) Sumitha Publishers

### අක්ෂරාණු

**'අක්ෂරාණු'** යනු කිසියම් ශබ්දයක් පදයක කිසියම් නිශ්චිත ස්ථානයක යෙදෙන විට ලියා දැක්වීම පිණිස යෙදෙන විකල්ප රූපය යි. 'ඉ' යන ස්වර ශබ්දය පදයක **මුල හැර** වෙනත් තැනක යෙදෙන විට එය ලියා දැක්වීම පිණිස යෙදෙන 'ි' යන රූපයත් 'ය' යන ව්‍යංජන ශබ්දය වෙනත් ව්‍යංජන ශබ්දයකට පසුව යෙදෙන විට එය ලියා දැක්වීම පිණිස යෙදෙන '්‍ය' යන රූපයත් 'අක්ෂරාණු' වේ.

### 1. අක්ෂර

අක්ෂර දෙ වර්ගයකි:

1 ප්‍රාණාක්ෂර

2 ගාත්‍රාක්ෂර

### ප්‍රාණාක්ෂර

**'ප්‍රාණාක්ෂර'** යනු පදයක මුල යෙදෙන ස්වර ශබ්දයක් ලියා දැක්වීම පිණිස යෙදෙන අක්ෂරය යි. 'ඉර' යන පදයෙහි මුල යෙදෙන 'ඉ' යන අකුර මෙනි. 'ප්‍රාණාක්ෂර' යනු ලෙව් ලැකියට අයත් පදයකි. එය කව් ලැකියෙහි එන්නේ 'පණකුරු' යනුවෙනි.

### ගාත්‍රාක්ෂර

**'ගාත්‍රාක්ෂර'** යනු ව්‍යංජන ශබ්දයක් ලියා දැක්වීම පිණිස යෙදෙන අක්ෂරය යි.

'ඉර' යන පදයෙහි යෙදෙන 'ර' යන අකුර මෙනි. 'ගාත්‍රාක්ෂර' යනු ලෙව් ලැකියට අයත් පදයකි. එය කව් ලැකියෙහි එන්නේ 'ගතකුරු' යනුවෙනි.

## 2. අක්ෂරාණු

අක්ෂරාණු තුන් වර්ගයකි.

i අල් ලකුණු
ii ස්වර පිලි
iii ව්‍යංජන පිලි

### i අල් ලකුණු

අල් ලකුණු යනු ගාත්‍රාක්ෂරයක ගැබ්වන ස්වරය ඉවත් කිරීමට යෙදෙන ලකුණු යි. එවැනි ලකුණු දෙකකි:

| | | | | |
|---|---|---|---|---|
| අ. කොඩිය | ් | ක | → | ක් |
| ආ. රැහැන | ් | ම | → | ම් |

(c) Sumitha Publishers

### ii ස්වර පිලි

**'ස්වර පිලි'** යනු පදයක **මුල හැර** වෙනත් තැනක යෙදෙන ස්වර ශබ්දයක් ලියා දැක්වීම පිණිස යෙදෙන අක්ෂරාණු විශේෂය යි.

'ඉ' යන ස්වර ශබ්දය ලියා දැක්වීම පිණිස යෙදෙන 'ි' යන පිල්ල මෙනි. මේ ස්වර පිල්ල **'ඉස් පිල්ල'** යන නමින් හැඳින්වේ.

### iii ව්‍යංජන පිලි

**'ව්‍යංජන පිලි'** යනු ව්‍යංජන ශබ්දයක් ලියා දැක්වීම පිණිස යෙදෙන අක්ෂරාණු විශේෂය යි. එවැනි ව්‍යංජන පිලි කිහිපයක් පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| අ. යංශය | ්‍ය | ක්-ය | → | ක්‍ය |
| ආ.රකාරාංශය | ්‍ර | ක්-ර | → | ක්‍ර |
| ඇ. රේඵය | ර්‍ | ර්-ක | → | ර්‍ක |
| ඈ. දකාරාංශය | ( | ද්-ව | → | ඬ |

### ස්වර පිලි හඳුන්වන නම්

සිංහලයෙහි එන ස්වර පිලිත් ඒවා හැඳින්වීමට යෙදිය යුතු නාමත් අතර යම් පොදු සම්මතයක් තිබීම සිංහලය හදාරන්නන්ට පහසුවකි. නිදසුනක් වශයෙන් දක්වතොත් 'ඇ' යන ස්වර ශබ්දය වෙනුවට යෙදෙන ස්වර පිල්ල හැඳින්වීමට අද යෙදෙන නම් කීපයකි:

ඇදය
ඇද පිල්ල
අස් පිල්ල
ඇකාරාංශය
හ්‍රස්ව මාත්‍රාංශය

මේ සියල්ල වෙනුවට **'ඇද පිල්ල'** යන නම යෙදීම වඩාත් සුදුසු ය. ඒ නම ස්වර පිලි හඳුන්වන වෙනත් නම් සමඟ ගැළපෙන හෙයිනි:

ඇල පිල්ල
ඉස් පිල්ල
පා පිල්ල
ගැට පිල්ල
උඩු පිල්ල
උස් පිල්ල

# 4

# අක්ෂර පරිමාණ

හැම අක්ෂර රූපයකට ම ආවේණික වූ උස ප්‍රමාණයක් ඇත. මේ පරිමාණ අනුව සිංහල අකුරු සියල්ල තුන් වැදෑරුම් ය:

1 මධ්‍ය අක්ෂර
2 ආරෝහණ අක්ෂර
3 අවරෝහණ අක්ෂර

මේ වර්ග කිරීම සඳහා යොදා ගන්නේ ප්‍රධාන වශයෙන් තීරු තුනකින් යුත් රාමුවකි. මැද පේළිය අතුරු පේළියකින් ද යුක්තය:

උඩු තීරුව
මැද තීරුව
යටි තීරුව




(c) Sumitha Publishers

**මධ්‍ය අක්ෂර**

'මධ්‍ය අක්ෂර' යනු මේ තීරු තුනෙන් මැද තීරුව තරම් උස ප්‍රමාණයක් ඇති අක්ෂර යි. 'ක' යන්න මෙනි.

**ආරෝහණ අක්ෂර**

'ආරෝහණ අක්ෂර' යනු මැද තීරුවේ පහළ සිට උඩු තීරුවේ මැද දක්වා විහිදෙන අකුරු යි. 'ම' යන්න මෙනි.

**අවරෝහණ අක්ෂර**

'අවරෝහණ අක්ෂර' යනු මැද තීරුවේ ඉහළ සිට යටි තීරුවේ පහළ දක්වා විහිදෙන අකුරු යි. 'ල' යන්න මෙනි.

**1. මධ්‍ය අක්ෂර : 23**

ප්‍රාණාක්ෂර : **2**

ඍ ඎ

ගාත්‍රාක්ෂර : **19**

ක ඝ
ග ඟ
ත න
ඩ ඬ
ශ ෂ
හ භ
ස ය
ර ණ
ජ ඦ
ෆ

අර්ධ ගාත්‍රාක්ෂර : **2**

ං ඃ